

## චෝදනා

කල - අකල නොසලකන
අධි වැහි හීන වැහි එක ළඟ
ගිගුරුම් බහුල
අකුණු විපතට මුල්වන
පතන අවිනීත

අව් රැලි
තාප ගිනි අවුලන
වැතිර අස අත
ප්‍රත්‍යන්ත ඇතැමෙක
නියංසා රකුසුට ඉඩදෙන

හිරු සඳු තාරකා අබිමන
ව්‍යාකූල
ලබන නින්දා නිම් නැති

වර්ෂා
කිම්ද මේ මෙහෙවරට
රාජකාරියට වන වෙනස
උග්‍ර නිග්‍රහ
උසුළු විසුළු

අහස
කලු කර
සියලු කාලගුණ හිමිකම්
බරපතළ
ව්‍යවස්ථා
උල්ලංඝනයක.

ජගත් රණතුංග

## නොපැතූ ආදරය

අතීතයක් ආදරයක් නොමැති අප හට
වර්තමානයක් සුබ අනාගතයක් ගැන පෙරුම් පුරා
දෙමාපියන්ගේ නොඅඩු ආශිර්වාදය මැද
එකමුතු වුනා නොවේද අපි දෙදෙනා
සැම දෙනාගේම සුභ පැතුම් මැද

අස්ථිර ලෝකේ ස්ථිර ප්‍රේමයක් පතා
පෙරුන්දම් නොපෙරුවෙමු අපි දෙදෙනා
සුන්දර ජීවිතයකට සැනසීමේ අවකාශය
පමණකි පැතුම් පැතුවේ අපි
එක හිත් ඇත්තන් වී මී යන තුරා

රන් කැටි හුරතල් දූ - පුතු සෙනෙහස ලබා දී මට
පිය පදවියෙන් මා සම්පූර්ණ කල ඔබ
දූනෙයි විටක මට මහ වීරයෙකු ලෙස
අප දිවි මග ගොඩනගන්නට
නොමදව වෙහෙස දරන ඔබ

කෙතරම් ආදරය කලත් පෙරදින මේ ලෝකේ
ඔබගේ අවංක සෙනෙහසට කලා ආදරය මං
ඉපදුනොත් මතු භවයෙක යලි මිනිසකු ලෙස
පතනෙමි ඔබ -ඉමා" මගේ ආදර බිරිඳ ලෙස

සංජික සමරනායක

## ඊනතුරා වසන්තය

සුළගේ හඬට කන්දෙමි..
අඳුරු වු දහවලක
වසාඇති පන්සලේ
දොර අසල..
සාදුකාරය නගන.

බුදු පහන මිලානය
පර මල් අතර තනිවුන
තටු ගසන හඩ ඇසේ
ගෙ කුරුල්ලෙක් අඳුරේ .

දරාගත නොහේදෝ අහස් කුස..
සඟවන්න තැත්කරන කඳුළු පොද
වැගිරේය..
අකීකරු වී නිබඳ.

මල් කොළ හැලී අහේනිව
ගස්වැල් ඇත ඔහේ බලාගෙන
ඉඩදෙමින් වැහිබිඳට
රිසී ලෙසක ගලන්නට.

දෝත පා වැහි දියට
පිපාසය නිවා ගමු
අකුණුසැර
එකතුකොට
උණුසුමට
පන පොවමු…

සුදුමැලිව ගිය
කොපුල්- කඳුළු වැල්
පිස දමමු..
මලසුනක මියැදුනු
වනමලින් ලොව දකිමු.

චන්ද්‍රිකා ද සිල්වා

## ඇයි දියණියේ ??

ඔබ ඉපදුන ඒ දිනයේ
කිරුළු පලන් රජෙක් වගේ
ඔබේ පියා සතුටු වුනේ
තරුණ යොවුන් පියෙක් ලෙසේ

ලස්සන කිරි කැටි දෝනිව
දෝතට ගෙන ආදරයෙන්
මුලු ලෝකෙම ජය ගත්සේ
සිප ගත්තා ආදරයෙන්

රැකියාවට පිට වන්නේ
දෝනිගෙ මූව සිඹිමින්නේ
දරුවා රැක ගන්නාසේ
දහස් වරක් කියමින්නේ

තාත්තාගේ වාහන හඬ
ඇසෙනා විට සිඟිති කනට
සුරංගනා වියක් ලෙසින්
සාලය වෙත දුව යන්නේ

දැන් දෝනිට වයස අටයි
තාත්තාගේ පිටුපස එයි
ලේ කිරි කර පෙව් අම්මව
නොපෙනෙයි පියතුම අබියස

මව්තුමියගේ සිතට දුකයි
සිතනා විට ඇගෙ සෙනෙහස
ඇයි දියණියෙ නොපෙන් වන්නේ
ඔබෙ අම්මට ඔබෙ සෙනෙහස

දරුවා පියතුමා සමඟ
සුරතල් වන වෙලාවල
අම්මගෙ හද පත්ල තුලින්
සිහින් සුසුම් පිටවන්නේ

දිනක් අම්මා ලෙඩ වීලා
රොහල් ගත කල විටදී
දෝනි හැඬුවා බිම පෙරළී
"අම්මව මට ඕනැ" කියා

දරුවා සනසවා ගන්න
පියාට හැකි වුනේම නැත
මවට තිබූ මේ සෙනෙහස
අම්මට දැනුනේ එවිටයි

"සුමදි නයන තාරා" කියා
නම තැබුවේ අම්මා කියා
දෝනිට පියතුමා කීවේ
අම්මා රෝහලෙ සිටිදා

අම්මා ගෙදර ආ දිනයේ
ඇය ළඟමයි චූටි දෝනි
ඇයි දියණියෙ නොපෙන්වන්නෙ
ඔබෙ පියාට, ඔබෙ සෙනෙහස

සුවිනීතා විජේසිංහ

## අබිසරු කුසුම්, සල්ලාල රජුන් සහ හිඟන්නන්



*උප මාතෘකාව*

### කබඩ් අන්තඃපුර වැනුම

විච්රි චිරි විච්රි චිරි බිංදු අහසින් වඩින
අකුරු සල්ලාල ඇස් නුරා සිහිනෙන් මුදන
පොතක පෙම් උණුහුමෙන් සියොළඟම කිලිපොලන
වහින සාහිත වැස්ස සතියක්ම හිත තෙමන

සොඳුරු කංචුක ඇඳන් මීන ඇස් නටවමින
මිතුරු මදහස් සරින් ලමා වෙතට එනුළ කියන
අනඟ තදබදය මැද තරඟයට මග බලන
බලන් අබිසරු කුසුම් පෙම් ගැනුම්කරු පතන

සලෙල නිරිඳෝ ඇවිද සොඳ ලියන් හඹා යති
දුලන රූසිරු හැඳින තැනෙක මඳකට රැඳෙති
සේල ගලවා සෙමින් ලියන් නිරුවත බලති
රූ සිරිය මදි වගෙයි ඇතුළු හද ගැබ සොයති

රුවින් රැජිණකි එමෙන් සොඳ සිතක් ඇති ලියකි
අනෙක් කිසිවෙකු නොවේ රජුන් අත පතන්නකි
ලේබලයේ රජ මිලකි ඇගේ ලමැදේ ඇළුණ
හිඟන බමරෙකු පැමිණ දුකින් ඉවතට ඇදින

තව ලියක් වැඳිරියකි එහෙත් පියකරු හදකි
මිලක් නැති ලියන් මැද හැංගිලා හඬන්නකි
කලාතුරකින් මිසක් කෙනෙක් නැවතී නොයති
ඉවක් ඇති හදක් ඇති දුගී බමරෙකු පතති

වැහි තුරල් වෙයි නැවත නොඑන ලෙස වසරකට
රජුන්, දුගියන් ඇදෙති එදිනෙදා නියඟයට
කැන්දාන ආ ලියන් ඇතුළු කුටියක සිරව
කබඩ් අන්තඃපුරේ මග බලති මධු සඳට

කූඹියා

## සාගී

ඔබ දයාබර බිරිඳක් විය
සෙනෙහෙබර මවක් විය
හිතාදර මිතුරියක් ද විය.
ඔබේ පැහැපත් පෙනුම, සිනහමුසු පෙනුම
කිසිදා අමතක නොවේ
ඔබ හමු වූ මුල් දිනයේම
ඔබ ගැන ඇති වූ පැහැදීම අදත්
එලෙසම
මා මතකයේ
ඔබ අතින් සැදුණු ඒ රසවත් රෑ කෑම
මා ළඟම හිඳ ගෙන
ලූණු මදි යයි කියා
තවත් ලූණු දමා ගෙන කෑ හැටි
මට දැනුත් මැවී පෙනේ.

මගේ දුව නැති විටක
ඔබ මට දුවක් වුණා
ටිකකට.. පැයකට.. දෙකකට..
නමුත් ඒ මතකය මා ළඟය සදහට
ඔබ නිවසේ දැල්වුණු මිණි පහන
දැන් නිවී ඇත! සදහටම.
නිවස දැන් පාලුය.. අඳුරුය
මංජු පවි!

මිනිසුන් අතර
මිනිස් ගති පිරිහෙන යුගයක
ඔබ වැනි ගුණවත් කතුන්
ලොවට අවැසි මොහොතක
ඔබ අපෙන් වෙන් වුණා සදහටම
ඔබ මෙසේ හදිසියේ
අපෙන් සමුගත්තෙ ඇයි?
මට කියන්න.. කියන්න.. සිහිනෙන්වත්
යස ඉසුරු තිබුණත්.. කොතැනක සිටියත්
මරණය වැළැක්විය නොහැකිය යන
බුදු වදන සැබෑ කරමින්
ඔබ අප අතරින් වෙන් වුණා!
අප කරන සෑම පින් බලයකින්ම
නිවන් සුව අත්කර ගන්න
නමුත් තව එකම එක වතාවක්
අප අතරට එන්න!

මල්ලිකා
බර්ලීන්.

## අනේ මටත් වෙඩි තියන්න

උන්ඩයක්
අහම්බෙන් කිසිවෙකුගෙ හදවතක්
සිදුරු නොකළ උන්ඩයක්
සුළඟෙ ඇවිදින්
ආදරය අරගෙන
මල් පෙත්තක දෙපතුල අද්දර
වැතිර සිඹිමින් අසයි විස්තර
අනේ මට කියන්න
මගේ මුහුණ නොබලා
අහක බලා මට කියන්න
ප්‍රේමය නම් කිම
පෙම්වත් එහෙත් ප්‍රේමය නොමදත්
පෙම්වතකුගේ අත්ලේ රැඳුණු
උනු නොවූ උන්ඩයක් වූ මං
ආදරයක ගැඹුර
එහි දිනුම පැරදුම
කඳුළු බිඳු ගලන
ඉනික්බිති දිලිසෙන වරුණ දුටු නොදුටු
ආදරවන්තයෙක් මං
නිල් අහස් තල
සළු පිළි උලා දමා හිරු බහින අරුම
දුහුල් වලා පටල ඉරා
සඳ දිලෙන සුමයුර
සියොත් ගී පියාඹා
තටු සළන ගගනය
නිමක් නොවනා සයුරේ
ගී හඬක අනෝමය
සියල්ල පරයා ඇයි මගේ හඬ දිනුම්
අනේ මට කියන්න
පරවෙන්න කකියන
මල්පෙත්තෙ නුඹ
ආදරය
සියල්ලෝ දුටු -නුඹ මම දුටු නොදුටු

*කඳුළු බිඳු ගලන*
*නෙත් තුළ රැඳෙන අරුම*
*එහි දිනුම පැරදුම*
*දෙකොපුල් මත වැටී*
*පොළොවට උරන*
*උනුසුම සුසුම*
*නවතින තුරු දුවන*
*හදවතේ ලේ බිඳු ගලන*
*සමග රැඳෙන අරුම*
*ආදරණීය උන්ඩයේ ඒ නමයි ආදරය*
*වෛරයෙන් ප්‍රේමය උපදීද*
*ප්‍රේමයෙන් වෛරය උපදීද*
*නොදන්නා*
*ප්‍රේමයට පුදන*
*ආදරවන්තයන් අත රැඳුණු*
*පරාජිත හෙට මියැදෙන*
*මල් පෙත්ත මං*
*නුඹට හැකිනම්*
*අනේ මට වෙඩි තියන්න*
*මට හැකිය ආදරය නාමයෙන්*
*මියැදෙන්න*

ලක්ෂ්මන් කොඩිතුවක්කු

## පොත් සල්පිලේ දී ය

ගැට පද පිරුණ
පිටු කළු ගැසුණ
පොත
මම,
රාක්කය මත
ඔබ
තව බොහෝ පොත් මැද
වෑයමින්
සිරගත කළ..

නොම රමණී
වන පැරණි
පොත
මම,
කියවනු අරුචි යැයි
කලකට ඉහත
ඔබ
නම් කළ..

බොඳ සිත්තමකි
මුල් පිට
මහ හිස්තැනකි
පසු පිට,
පෙරවදන්
පසුවැනුම්
අයිති
නැතියෙන..

දුම් රොටුවක් විලස
අතීතයටම
එක්වුණ
ඉතිහාස පොත
මම,
හැම රහසක්ම
අකුරු යට
වළ දමා
හිනැහුණ..

තවමත්
අකම්පිත
පොත
මම...
අලුත් පොත් අතැතිව
සිටින
ඔබ කිසිවෙකුට
නොපෙනෙන..

රසික ජයකොඩි